(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 52.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2010 නොවැම්බර් මස 26 වැනි සිකුරාදා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0096/'10

1.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 1948 වර්ෂයේ සිට 1994 වර්ෂය දක්වා එක් එක් වර්ෂය අවසාන වන විට;

(ii) 1995 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා, එක් එක් වර්ෂය අවසානයේ හා 2010 වර්ෂයේ මේ දක්වා;

ගෙවීමට තිබූ සමස්ත රාජ්‍ය ණය ප්‍රමාණය දේශීය ණය සහ විදේශීය ණය ලෙස වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (i) හි සහ (ii) හි සඳහන් කාලපරිච්ඡේදයන්හි එක් එක් වර්ෂය සඳහා මුළු ණය ක්‍රමක්ෂය (මුල් මුදල + පොලිය වශයෙන් ගෙවූ මුදල) කොපමණ ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 1948 වර්ෂයේ සිට 2003 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය, 2003 වර්ෂය, 2004 වර්ෂය, 2005 වර්ෂය, 2006 වර්ෂය, 2007 වර්ෂය සහ 2008 වර්ෂයේ සිට මේ දක්වා වූ කාලපරිච්ඡේදය යන කාල වකවානු සඳහා,

(i) ලෝක බැංකුව

(ii) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

(iii) ආසියානු සංවර්ධන බැංකුව

(iv) ජපන් ජාත්‍යන්තර සහයෝගීතා බැංකුව

(v) ඇමෙරිකා එක්සත් ජනපදය

(vi) ජපානය

(vii) යුරෝපා සංගමයේ (EU) රටවල්

(viii) ඉන්දියාව

(ix) චීනය

යන සංවිධාන සහ රටවල් වෙත ගෙවිය යුතුව තිබූ මුළු ණය ප්‍රමාණයන්, ඒ සඳහා වන සාමාන්‍ය පොලී වියදමද සමගින් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) එමෙන්ම පසුගිය වර්ෂ 5 තුළ එක් එක් වර්ෂය සඳහා ඒක පුද්ගල ආදායම සමග සන්සන්දනාත්මකව ඒක පුද්ගල ණය බර ප්‍රමාණයන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0359/'10

2\.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ශ්‍රී ලංකාව තුළ ඇති,

(i) රජයේ ජාතික පාසල් සහ රජයේ අනෙකුත් පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) පළමු ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වා ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන රජයේ පාසල් සංඛ්‍යාව සහ සියලුම පන්ති සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් ඉගැන්වීම් නොකරන නමුත් අවම වශයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගැන්වීම සිදුකරන රජයේ පාසල් සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) බණ්ඩාරගම සහ මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) ඉංග්‍රීසි භාෂාව භාවිතය සම්බන්ධ අනාගත අභියෝගවලට මුහුණදීමට සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම අවම වශයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් උගන්වන පාසල් දෙකක්වත් වහාම ආරම්භ කළ යුතු බව එතුමා පිළිගන්නේද;

(ii) නොඑසේ නම්, ඊට ඉදිරිපත් කරන විකල්ප කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0406/'10

3\.

ගරු තිලංග සුමතිපාල මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කොළඹ දිස්ත්‍රික්කයේ ඇති;

(i) පර්චස් 4 ට අඩු බිම් ප්‍රමාණයක පිහිටි අඩු පහසුකම් සහිත නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) අඩු පහසුකම් සහිත අනවසර නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) අනවසර නිවාස පිහිටි මුළු භූමි ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම අඩු පහසුකම් සහිත නිවාස, පහසුකම් සහිත නිවාස බවට පත්කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0410/'10

4\.

ගරු දිළුම් අමුණුගම මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2004 වර්ෂයේ රාජ්‍ය සේවයේ සිටි සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) වර්ෂ 2010 වන විට රාජ්‍ය සේවයේ සිටින සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) 2004 වර්ෂයේ සිට මේ දක්වා රාජ්‍ය සේවයට බඳවා ගෙන ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) තවදුරටත් මෙම සේවක සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ වැඩි කිරීමට ගන්නා ක්‍රියාමාර්ගය කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0463/'10

5.

ගරු නූර්දීන් මෂූර් මහතා,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2004 සිට 2010 දක්වා වූ කාලය තුළ නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ ප්‍රතිපාදනවලින් සෘජු වශයෙන් හෝ එම අමාත්‍යාංශ යෝජනා සැලස්මක් අනුව වෙනත් අමාත්‍යාංශ ප්‍රතිපාදනවලින් හෝ ක්‍රියාත්මක කළ වැඩ සටහනක් යටතේ, පුත්තලම, මන්නාරම, වවුනියාව යන දිස්ත්‍රික්කවල අවතැන්වූ පවුල්වල තරුණියන්ට ස්වයං රැකියාවල නියැළීම පිණිස එක් එක් වර්ෂයේ පවත්වන ලද මැහුම් පාඨමාලාවන් ගණන කොපමණද;

(ii) එම මැහුම් පුහුණු පාඨමාලාවන් සඳහා එක් එක් වාරයන් සඳහා තෝරා ගන්නා ලද තරුණියන්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) එම එක් එක් මැහුම් පුහුණු පාඨමාලාවන් සඳහා වෙන්කරන ලද මුළු මුදල, එයින් වියදම් කරන ලද මුදල සහ එම වැය ශීර්ෂය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම පාඨමාලාවන් සඳහා පුහුණුකරුවන් ලෙස බඳවා ගන්නා ලද අයවලුන්ගේ සංඛ්‍යාව, නම් සහ ලිපිනයන්, ඔවුන් වෙනුවෙන් ගෙවීම් කළ අකාරය සහ ගෙවන ලද ප්‍රමාණය කවරේද යන්න එක් එක් වර්ෂයට අදාළව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0498/'10

6.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ඇති පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම කොට්ඨාසවල සේවය කරන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාස වෙන් කර තිබෙන ජන අනුපාතය කුමක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ පවුල් සෞඛ්‍ය සේවා කොට්ඨාස වෙන් කර ඇති ආකාරය සතුටුදායක වන්නේද;

(ii) පවුල් සෞඛ්‍ය සේවයේ නිරත වී සිටින නිලධාරිනියන්ට ලබා දී ඇති පහසුකම් සතුටුදායක තත්ත්වයක පවතින්නේද ;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0550/'10

7.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ ගංගි පාලමෙහි ඉදිකිරීම් අවසන්ව ඇත්තේද;

(ii) නොඑසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීමට මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(ii) ඒ සඳහා විදේශ ආධාර ලැබුනේ නම්, ආධාර ප්‍රදානය කළ රට සහ අදාළ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0634/'10

8.

ගරු අනුර දිසානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010.08.01 වන විට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් සිදුකරනු ලැබූ නව බඳවා ගැනීම් කවරේද;

(ii) ජනසභා ලේකම් තනතුරට බඳවා ගැනීම ඊට අන්තර්ගත වන්නේද;

(iii) එම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය අවම සුදුසුකම් කවරේද;

(iv) ජනසභා ලේකම් තනතුරු සඳහා බඳවා ගන්නා සංඛ්‍යාව කොපමණද;

(v) මේ වන විට දැන්වීම් ප්‍රසිද්ධකර, සම්මුඛ පරීක්ෂණ කැඳවා තිබේද;

(vi) එසේ නම්, සම්මුඛ පරීක්ෂණ සඳහා සහභාගී වූ සංඛ්‍යාව කොපමණද;

(vii) එයින් බඳවා ගනු ලබන සංඛ්‍යාව කොපමණද;

(viii) එම බඳවා ගැනීම් ආරම්භ කරන හා අවසන් කරන දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම නව තනතුරු සඳහා අදාළ අමාත්‍යාංශයේ අයවැය ඇස්තමේන්තු මගින් වෙන් කර ඇති මුදල කවරේද;

(ii) මුදල් වෙන්කොට නොමැති නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0466/'10

9.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) රජයේ ප්‍රතිශක්තිකරණ වැඩපිළිවෙළ අඩාල වී ඇති බවත්, ඒ පිළිබඳව විපක්ෂය වගකිවයුතු බවත් හිටපු සෞඛ්‍ය අමාත්‍යවරයා 2010.06.10 දින පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කළ බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) රජයේ ප්‍රතිශක්තිකරණ වැඩ පිළිවෙළ අඩාළ වී තිබේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

(iii) ප්‍රතිශක්තිකරණ වැඩ පිළිවෙළ අඩාළ වී ඇත්නම්, එය නැවත සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0481/'10

10.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වාණිජ බැංකු සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් බැංකුව සතු ශාඛාවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) විදේශ විනිමය ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් කටයුතු කිරීමට මහ බැංකුවට ඇති බලය මෙම බැංකුවලට පවරා තිබේද;

(ii) විදේශ විනිමය හුවමාරු කිරීමේ නිරත බැංකු නොවන සමාගම් සංඛ්‍යාව කොපමණද;

(iii) එම සමාගම්වල නම් සහ ඒවායෙහි පාර්ශ්වකරුවන්ගේ හෝ අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(iv) විදේශ විනිමය හුවමාරුව සඳහා එම සමාගම් තෝරා ගැනීමට භාවිතා කළ නිර්ණායකයන් කවරේද;

(v) පසුගිය වර්ෂ දෙක තුළ එක් එක් වර්ෂයේ දී ඔවුන් හුවමාරු කළ ප්‍රමාණය කොපමණද;

(vi) විදේශ විනිමය හුවමාරු කිරීමෙහි නිරතවීමට මෙවන් බැංකු නොවන ආයතනවලට ඉඩ ලබා දීම තුළින් රටට ලැබෙන වාසි කවරේද;

(vii) එවැනි ආයතන සංඛ්‍යාව වැඩි කරනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0499/'10

11.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබෙන රජයේ රෝහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝහල් වර්ගීකරණය කර ඇති ආකාරය කවරේද;

(iii) එක් එක් රෝහලට ලබා දී ඇති ගිලන් රථ සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ වර්තමාන තත්ත්වය කුමක්ද;

(v) ඒවා සෑහීමකට පත්විය හැකි මට්ටමක පවතින්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0551/'10

12.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ යාංඔය පාලමෙහි ඉදිකිරීම් අවසන්ව ඇත්තේද;

(ii) නොඑසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීමට මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(ii) ඒ සඳහා විදේශ ආධාර ලැබුනේ නම්, ආධාර ප්‍රදානය කළ රට සහ අදාළ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන් ද?

0500/'10

13.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඇති එක් එක් ගොවිජන සේවා බල ප්‍රදේශය තුළ තිබෙන මහා වාරි සහ සුළු වාරි වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටා ඇති ස්ථාන සහ එම වැව්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2008 සහ 2009 වසර දෙක තුළ ඉහත වැව්වලින් පිළිසකර කරන ලද වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් සහ පිහිටි ස්ථාන කවරේද;

(iii) ප්‍රතිසංස්කරණයට ලක් නොවූ වැව්වල නම් සහ ඒවා පිහිටා ඇති ස්ථාන කවරේද;

(iv) එම වැව් පිළිසකර කිරීමට ගතවන කාලය නිශ්චිත වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0552/'10

14\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ ඉදිකිරීමට යෝජිතව තිබූ කල්ලඩි පාලමෙහි ඉදිකිරීම් අවසන්ව ඇත්තේද;

(ii) නොඑසේ නම්, එහි වර්තමාන තත්ත්වය කවරේද;

(iii) එම පාලම ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම පාලම ඉදිකිරීමට මුදල් ආයෝජනය කරන ලද ආයතනයේ නම කවරේද;

(ii) ඒ සඳහා විදේශ ආධාර ලැබුනේ නම්, ආධාර ප්‍රදානය කළ රට සහ අදාළ මුදල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම පාලමේ ඉදිකිරීම් කටයුතු කරනු ලබන ආයතනයේ නම කවරේද;

(ii) එම ආයතනයට ඉදිකිරීම් කටයුතු පවරනු ලැබූ පදනම කවරේද;

(iii) ඉදිකිරීම් කටයුතු පැවරීම සඳහා ටෙන්ඩර් කැඳවන ලද්දේද;

(iv) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතන හා ඉදිරිපත් කළ මිල ගණන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන් ද?

0578/'10

15\.

ගරු රවි කරුණානායක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වාර්ෂිකව ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලවලින් උපාධි ලබා පිටවන වෛද්‍යවරු සංඛ්‍යාව කවරේද;

(ii) වෛද්‍යවරු වශයෙන් ලියාපදිංචි වීමට සුදුසුකම් ලබන විදේශ වෛද්‍ය උපාධිධාරීන් සංඛ්‍යාව කවරේද;

(iii) ඉහත කී උපාධිධාරීන් වෛද්‍යවරු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා පවත්වනු ලබන විභාග, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් පවත්වනු ලබන්නේද සහ 2010.01.01 දින සිට එය වෙනත් අධිකාරියකට පවරා තිබේද;

(iv) එසේ පවරා තිබේ නම්, එම නව අධිකාරියේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වසරක කාලයක් සඳහා මෙරටට අවශ්‍ය වන වෛද්‍යවරු සංඛ්‍යාව කවරේද;

(ii) වෛද්‍යවරයකුට ගෙවනු ලබන සාමාන්‍ය වැටුප කවරේද;

(iii) ඔවුන්ට ලබාදී ඇති අනෙකුත් ප්‍රතිලාභ කවරේද;

(iv) ශ්‍රී ලංකාවේදී සුදුසුකම් ලැබූ වෛද්‍යවරුන් හට නිවාඩු ලබා විදේශගත වීමට අවසර තිබේද;

(v) එසේ නම්, ඔවුන්ට එලෙස නිවාඩු ලබාගෙන විදේශ ගතවීම සඳහා අවසර ලබාදෙන කාලසීමාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1

විසර්ජන පනත් කෙටුම්පත (2011) — (සිව්වැනි වෙන් කළ දිනය) — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2010 නොවැම්බර් 22) [1].

*2.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— මැනුම් පනත යටතේ නිවේදනය,— 2002 අංක 17 දරන මැනුම් පනතේ 41 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 65 වැනි වගන්තිය යටතේ ඉඩම් අමාත්‍යවරයා විසින් අනුමතකර 2005 නොවැම්බර් මස 23 වැනි දින අංක 1420/20 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ "2005 ඉඩම් මැනුම් සභා (වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර)" නියෝගයේ 3 වැනි ඡේදය සංශෝධනය කිරීම සඳහා 2009 දෙසැම්බර් මස 18 වැනි දින අංක 1633 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.10.19 වැනි දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

*3.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව,— 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, වැඩබලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 27 දරන නියමය අනුමත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 27 දරන නියමය

වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2008 අංක 43 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය අත්තිකාරම් ගිණුම — අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් වෙනස් කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,400,000,000<br>රු. 2,162,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 100,000,000<br>රු. 960,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2009.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ ආචාර්ය සරත් අමුණුගම,
වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2010.07.03 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත)

*5.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*6.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2007,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2007.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*7.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් 2006,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2009.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද 2006.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.05.05 දින සලකා බලන ලදි.)

*8.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව 2007,— 1984 අංක 06 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*9.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව 2006,— 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනතේ 40(3) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි මස 01 වැනි දින සිට 2006 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*10.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව 2006,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වැනි වගන්තිය අනුව සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වැනි වගන්තිය අනුව 2009.09.09 වැනි දින ඉදිරිපත් කරන ලද 2006 ජනවාරි 01 වැනි දින සිට 2006 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(විද්‍යා හා තාක්ෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2009.08.06 දින සලකා බලන ලදී.)

*11.

බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*12.

රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*13.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*14.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*15.

පීඩාකාරී ආයුධ (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*16.

සමථ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

17.

තාරුණ්‍යයට හෙටක් සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත—දෙවැනි වර කියවීම

18.

රතු පියුම (ජාත්‍යන්තර) ශ්‍රී ලංකා සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත— දෙවැනි වර කියවීම

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

[1] "පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.